මානුෂීය සේවායතන සමූහය

# සංදර්භ විශ්ලේෂණය (Rapid Context Assessment)

ජනවාරි 2008

CONSORTIUM OF CHA HUMANITARIAN AGENCIES

ISO 9001 REGISTERED

## ජාතික මට්ටමේ විශ්ලේෂණය


ආර්ථික සංදර්භය 2
මානව හිමිකම් 2
පරිසරය 2
සිවිල් සංවිධාන සහ මාධ්‍යය අවකාශය 3
මානුෂීය සහ සංවර්ධනයට ඇති අවකාශය 3


## දිස්ත්‍රික්ක පිළිබඳ විශ්ලේෂණය


අම්පාර 4
මඩකලපුව 4
කොළඹ 4
යාපනය 5
මන්නාරම 5
ත්‍රිකුණාමලය 6
වව්නියාව 7


## ප්‍රවණතාවන් විශ්ලේෂණය කිරීම

| | |
|---|---|
| ආර්ථික සංදර්භය | ↘ |
| මානව හිමිකම් | ↘ |
| පරිසරය | ↗ |
| සිවිල් සංවිධාන සහ මාධ්‍යය අවකාශය | ↘ |
| මානුෂීය සහ සංවර්ධනයට ඇති අවකාශය | ↘ |

# විධායක සාරාංශය



2008 වසරේ ජනවාරි මස 24 වෙනි දින දක්වා වූ සති හතර තුළ යුද්ධය හේතුවෙන් මිය ගිය සංඛ්‍යාව පෙර මාසය හා සසඳන විට ඉතා දැඩි ලෙස ඉහල ගොස් ඇති බව මාධ්‍යය මගින් ලබා ගත් දත්ත සනාථ කරයි. කෙසේ වුවද අත්අඩංගුවට ගැනීමේ සහ රඳවා ගැනීමේ සිද්ධීන් වාර්තාවීම් සැලකිය යුතු අයුරින් පහත ගොස් ඇත.

මෙම කලාපයෙන් ඉදිරිපත් කරනු ලබන සංදර්භ විශ්ලේෂණයේදී ශ්‍රී ලංකාවේ ආර්ථිකය පිළිබඳව විවරණයක් කරනු ලබන අතර එමගින් ඉදිරි කාල පරිච්ඡේදයන්ට අදාලව ඉදිරිපත් කරනු ලබන විශ්ලේෂණයන් සඳහා වූ සංදර්භය සකස් වනු ඇත. පසුගිය 25 වසරක කාලය තුළ දී මෙරට යුද්ධය නොතිබුණා නම් ආර්ථිකය මීට වඩා යහපත් තත්ත්වයට පත්වනු නිසැකය. එහෙත් මෙවැනි යුද වාතාවරණයන් මැද වුවද ආර්ථිකය සැලකිය යුතු යම් නම්‍යතාවයන් පෙන්වා ඇති අතර එයට යුද්ධය ද යම් දායකත්වයක් දක්වා ඇත. කෙසේ වෙතත් නිදහස් ආර්ථිකය නිසා වූ ව්‍යුහාත්මක වෙනස්කම් ද මේ සඳහා වඩා වැදගත්වේ.

සාමාන්‍යයෙන් ගත් කළ පෞද්ගලික අංශයේ කුඩා ගොවියාගේ සිට මහා පරිමානයේ ව්‍යාපාරයන් දක්වා වෙළඳපොල ඇති අවස්ථාවන්ට ප්‍රතිචාර දක්වන අතර මෙයට උදාහරණයක් ලෙස පෞද්ගලික අංශයේ අපනයන ක්ෂේත්‍රයේ ඉහල තලයක සිටින ඇඟ`ම් කර්මාන්තය සහ වෙනත් සැහැල්ලු අපනයන් දැක්විය හැකිය. ජාත්‍යන්තර ප්‍රදායකයන් විසින් දෙන ලද ප්‍රදානයන්ල සෘජු විදේශ ආයෝජනයන් සහ විශේෂයෙන්ම මැදපෙරදිග රැකියාවන්හි නියුතු ශ්‍රමිකයන් ගේ ඉපැයීම ද මේ සඳහා දායකවී ඇත. කෙසේ වෙතත් මෑතභාගයේ දී යුද්ධය සඳහා වන වියදම් අධිකවීමත්ල උද්ධමනය ඉහලයෑමත් ණීයුධ-අපනයනණී පෙරදැරිව සිදුවන වර්ධන ආකෘතියට යම් අවාසිදායක බලපෑම් එල්ල කර ඇත.

යුද්ධය සැලකිල්ලට ගැනීමේදී පුළුල් ලෙස අවබෝධ කර ගත හැකි අදහස වන්නේ වාර්ගික අර්බුදයට රජය හමුදාමය විසඳුමක් සොයන බවයි. මෙම ප්‍රතිපත්තියට විරුද්ධ විවේචනයන් සියල්ල ත්‍රස්තවාදයට උදව් දෙන්නන් ලෙස නිර්වචනය කිරීමට පෙළඹී ඇත.

මෙවැනි වාතාවරණයක් මධ්‍යයේ යුද්ධයට විරුද්ධව කිසියම් ආකාරයකට ක්‍රියාකාරකම් සිදු කරන සිවිල් සමාජ සංවිධානයන්ට වඩා යුද්ධයට සහයෝගය දක්වන සිවිල් සංවිධාන ක්‍රියාකාරකම්වලට වඩා ප්‍රමුඛ ස්ථානයක් ලබාදීමල මාධ්‍යයේ ඇතැම් කොටස්වල ස්වයං වාරණ පනවා ගැනීමට ද හේතු විය. පාර්ලිමේන්තුවේ ප්‍රධාන විපක්ෂය ද මේ සඳහා විරුද්ධව දැඩි හඬක් නැගීමට අපොහොසත්වී ඇත.

නව වසර උදාවීමත් සමඟම සිදු වූ ද්‍රවිඩ මන්ත්‍රීතුමා ගේ ඝාතනය මානව හිමිකම් සහ නීතියේ ආධිපත්‍යයට අසුභදායක බවක් පෙන්නුම් කළ අතර පසුගිය මාසය පුරා ප්‍රවෘත්තිවල එවැනි ප්‍රචණ්ඩකාරී අවස්ථාවන් පිළිබඳ වාර්තාවන් ප්‍රමුඛත්වයක් ගැනීමට සමත්විය. සටන් විරාම ගිවිසුම අවලංගු කිරීමල මානුෂීය සේවා සපයන ආයතනයන්හි අවධානයට දැඩිව ලක්වී ඇත්තේ මේ හේතුවෙන් යුද්ධය පවතින කලාපයේ විශේෂයෙන්ම එල්ටීටීඊ පාලන ප්‍රදේශයේ මානුෂීය සේවා කටයුතු සිදුකිරීමට ඇති අවකාශය සීමා කිරීමට ඉඩ ඇති බැවිනි. එක්සත් ජාතීන් ගේ සරණාගත කොමිසමේ වාර්තාවන්ට අනුව 2007 අවසන්වන විට මෙරට අභ්‍යන්තරව අවතැන්වූ පිරිස 188 000 ක් පමණවන අතර රජය දැඩිව එය ප්‍රතික්ෂේප කරයි. විශ්වාසය ගොඩනැගීමල ස්ථාවරත්වයක් ඇති කිරීම සහ මානුෂීය සහන සැපයීමේ ක්‍රියාකාරකම් සඳහා පහසුකම් සැපයීම සඳහා ජාතික සහ දිස්ත්‍රික් මට්ටමින් හමුදා සම්බන්ධීකරණ නිලධාරීන් පත් කර ඇත. නැගෙනහිර පළාතෙන් පොලිස් නිලධාරීන් ලෙස කාන්තාවන් 50 ක් ඇතුළුව 200 ක දෙමළ වාර්ගික පිරිසක් දැනට බඳවා ගෙන ඇති අතර මෙම සංඛ්‍යාව 1000 දක්වා වැඩි කිරීමට ඉලක්ක කර ඇත.

## දර්ශකය

| | | | | | |
|---|---|---|---|---|---|
| වෙනසක් නැත | → | මද ප්‍රගතියක් පෙන්වයි | ↗ | මද පිරිහීමක් පෙන්වයි | ↘ |
| සැලකිය යුතු ප්‍රගතියක් පෙන්වයි | ↑ | සැලකිය යුතු පිරිහීමක් පෙන්වයි | ↓ | | |

# ජාතික මට්ටමේ විශ්ලේෂණය

## ආර්ථික සංදර්භය

*යුධ වාතාවරණය මධ්‍යයේ ආර්ථික වර්ධනය*

සිවිල් යුද්ධ වාතාවරණය මධ්‍යයයේ වුවද පසුගිය විසිපස් වසර පුරා ශ්‍රී ලංකාවේ ආර්ථිකය සැලකිය යුතු ආකාරයෙන් නම්‍යශීලි වර්ධනයක් පෙන්නුම් කර ඇත. 1983 සිට 2006 දක්වා වූ වසර 24 න් 13 ක කාලයක් පුරා දේශීය දල නිෂ්පාදනය 5 හෝ ඊට වැඩි අගයක් ගත් අතර මෙම කාලපරිච්ඡේදය තුළ වසර 6 ක් 4 කට වඩා අඩු නොවූ අගයක් පෙන්නුම් කර ඇත. ඍන අගයක් ලබා ඇත්තේ 2001 වසරේදී පමණි. යුද්ධය නොතිබුණි නම් ආර්ථිකය වඩාත් යහපත් වනු ඇති බව නිසැකයෙන්ම පැවසිය හැකිය.

කෙසේ වෙතත් යුද්ධය සඳහා යන වියදම් ද ආර්ථිකයේ මෙම නම්‍යතාවයට යම් අයුරින් දායකවිය. රටේ දේශපාලන ක්ෂේත්‍රයේ ඇතිවන කවර ආකාරයේ වෙනස්කම් සිදුවුව ද යුද්ධය දිගින් දිගටම පැවතිය ද 1970 අගභාගයේ දී ඇරඹි නිදහස් ආර්ථික රටාව හේතුවෙන් පෞද්ගලික අංශය ඔවුන් ගේ ආයෝජනයන් සහ නිෂ්පාදනය යම් මට්ටමකින් පවත්වා ගෙන යාමට සමත්විය. ආයෝජනයල දල දේශිය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස දැක්වුවහොත් 1983 සහ 2006 කාල පරිච්ඡේදය තුළ දී එය 21% ඉක්මවා ගිය අතර එම කාලය තුළ වසර 10 ක් ම එය 25% ක් ඉක්මවා ගොස් ඇත. රට තුළට ස්ථාවර ලෙස විදේශාධාර ගලා ඒම සහ ඍජු විදේශ ආයෝජනයන් ආකාර්ෂණය කර ගැනීමට සමත්වීමත් මෙය ඉහල අගයක පවත්වා ගෙනයාමට හැකිවූ අතර වසර 2000 මැදභාගයේ දී ඩොලර් මිලියන 2000 ක් ද ඉක්මවීමට සමත් වූ ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් ගේ විදේශ ආදායම් ඉපැයීම් ද ස්ථාවර ආර්ථිකයක් පවත්වාගෙනයාමට ඉහල දායකත්වයක් සැපයිය. පසුගිය වසර 30 තුළ අපනයන ආදායම දේශිය දල නිෂ්පාදනයෙන් 25-30% අතර අගයක පවත්වා ගෙන යාමට සමත්වීම දේශිය දල නිෂ්පාදනයට වන බාහිර බලපෑම් අඩු කිරිමට සමත්විය.

කෙසේ වෙතත් යුද්ධයට යන වියදම තවත් ඉහල යෑමෙන් සහ පරිභෝජනය මිරිකා දැමී-මෙන් ද ආයෝජන පහත වැටෙන අන්දමට ව්‍යාපාරික පරිසරය අහිතකර තත්ත්වයකට පත්වීමෙන් මෙම තත්ත්වයන් වෙනස් විය හැකිය. විශාල අයවැය පරතරයන් ද අධික පිරිවැය සහිත විදේශ ණය ලබාගැනීම් ද දුර්වල ආර්ථිකයට මඟ පාදනු ඇත. වාර්ෂික උද්ධමනය දැනටමත් 20% ඉක්මවා ගොස් ඇත. ලොව පුරා දුර්වල ආර්ථික රටාවක් පැවැතිම අපේ අපනයන්ට අහිතකර බලපෑම් ඇති කරයි. යුරෝපා කොමිසමේ ණීඩැබැර්කසිැ ̆ හිචැප දං ජරුැ-ැරුැබජි ජකම්ණී :ධීජ- නම් වෙළඳ සහනය ලබා ගැනීමට සමත්ව ඇති එකම ආසියානු රට ශ්‍රී ලංකාව වන අතර එමගින් අපේ අපනයන්ට යුරෝපා වෙළඳපොලට පිවිසිමට යම් සහනයන් සලසා ඇත. ණීචිරස්ථායි සංවර්ධනය සහ යහපාලනය" සඳහා 2005 දී ලබාදෙන ලද මෙම සහනය මෙම වසරේ අවසානයේ දී නැවත අළුත් කිරීමට නියමිත වන අතර ඒ සඳහා කිසිදු පොරොන්දුවක් හෝ සහතිකයක් නැත. එමනිසා ආරථිකයේ ලක්ෂණ සියල්ලම ඒ අපේක්ෂිත ආකාරයන්ම සුභදායක වන්නේ ද නැත.

## මානව හිමිකම්

| | | 2007 නොවැම්බර් 24 සිට 2007 දෙසැම්බර් 23 | 2007 දෙසැම්බර් 24 සිට 2008 ජනවාරි 23 |
|---|---|---|---|
| **උල්ලංඝනයන්** | **ලක් වූ පිරිස** | **එකතුව** | **එකතුව** |
| පැහැර ගැනීම් | සිවිල් ජනතාව | 8 | 4 |
| අත් අඩංගුවට ගැනීම් | සිවිල් ජනතාව | 1814 | 369 |
| පහරදීම් | සිවිල් ජනතාව | 0 | 3 |
| රඳවා ගැනීම් | සිවිල් ජනතාව | 1467 | 346 |
| බලහත්කාරයෙන් අවතැන් කිරීම් | සිවිල් ජනතාව | 0 | 16 |
| ශාරීරික හිංසා කිරීම් | හමුදාව | 194 | 377 |
| | සිවිල් ජනතාව | 94 | 157 |
| | එල් ටි ටි ඊ | 232 | 335 |
| ජිවිතක්ෂයට පත්කිරීම් | හමුදාව | 54 | 105 |
| | සිවිල් ජනතාව | 98 | 84 |
| | එල් ටි ටි ඊ | 656 | 874 |

ඉහත දත්තවලින් පෙන්නුම් කරන්නේ තෝරාගත් ප්‍රවෘත්ති පත්‍ර සහ වෙබ් අඩවිවල වාර්තාවූ තෝරා ගත් ප්‍රචණ්ඩකාරී අවස්ථාවන් වන අතර 2007 දෙසැම්බර් සහ 2008 ජනවාරි අතර සංසදනයක් සිදු කර ඇත. ඉහත දත්තයන් ගෙන් පෙනී යන්නේ ඝාතනල තුවාල සිදුකිරීම්ල බලහත්කාරයෙන් අවතැන් කිරීම් සහ පහරදීම් පිළිබඳ වාර්තාවීම් පසුගිය මාස දෙක ඇතුලත ඉහල ගොස් ඇති බවයි. පෙර මාසය හා සසඳනවිට පැහැරගැනීම්ල අත්අඩංගුවට ගැනීම් සහ රඳවා ගැනීමේ සංඛ්‍යාවේ යම් අඩුවීමක් මෙහිදී පෙන්නුම් කරයි. මේ පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු ලබා ගැනීම සඳහා hrac@cha.lk ට ලියන්න.

## පරිසරය

වර්තමානයේ දී ලෝකයේම අවධානය යොමුව පාරිසරික ප්‍රවනතාවන් වන පාරිසරික චිරස්ථායිභාවයල දේශගුණික විර්යාස සහ ගෝලීය උෂ්ණත්වය ඉහලයාම වැනි කරුණු කෙරෙහි ශ්‍රී ලංකාව ද දැඩි අවධානයක් දක්වා ඇත.එහි ප්‍රතිඵලයක් ලෙස පාරිසරික චිරස්ථායි සංවර්ධන ව්‍යාපෘති කෙරහි නැඹු-රුවීමේ වර්ධනයක් දකින්නට ලැබේ. කෙසේ වුවද සමහර ජිවිකාවන් සහ සංවර්ධන ව්‍යාපෘතිල පරිමානය සහ තිබෙන සම්පත් ඉක්මවා යන අරමුණු තුළ පිහිටුවීම හේතුවෙන් දිගුකාලින පාරිසරික හානීන් ගෙන ඒමට තුඩුදිය හැකි බව ණේ යයි. (උදාහරණයක් ලෙස ගෙවතු වගාවන් වානිජ ව්‍යාපාර බවට පත් කිරීමත ගෘහ කර්මාන්තයන් මධ්‍යම පරිමානයේ කර්මාන්ත බවට පත් කිරීමත සම්ප්‍රදායික ධීවර බෝට්ටු වෙනුවට වානිජ මට්ටමේ ධීවර යාත්‍රා භාවිතා කිරීමත ප්‍රමාණවත් යටිතල පහසුකම් නොමැතිව විශාල පරිමානයේ නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ආදිය දැක්විය හැකිය.)

පරිසරය ආරක්ෂා කිරීමත් ආදයම් ප්‍රවර්ධනයත් එකට සම්බන්ධ කරමින් බොහෝ දිස්ත්‍රික්කවල ප්‍රතිචක්‍රිකරණ වැඩසටහන් ආරම්භ කර ඇත. ප්‍රතිචක්‍රිකරණයේ දී වඩාත් ලාභදායි වන්නේ පොලිතින්ය. කෙසේ වෙතත් වීදුරුල යකඩ සහ කාඩ්බෝඩ් ද ප්‍රතිචක්‍රිකරණය කිරීම සඳහා රැස් කරනු ලැබේ. ශ්‍රී ලංකාවේ පාරිසරික වශයෙන් චිරස්ථායි වෙනත් ව්‍යාපෘති අතර කාබනික පොහොර භාවිතයෙන් වගා කිරීම සහ ගෙවතු වගාවන් සංවර්ධනය කිරීම සහ පුළුල් කිරීම වැනි ව්‍යාපෘති සඳහා ලැබෙන්නා වූ පිළිගැනීම සහ සහ සහයෝගය වර්ධනය වෙමින් පවතී. අනිත් අතට කෘෂිකර්මික කටයුතු සඳහා ඒක පුද්ගල රසායනික ද්‍රව්‍යය භාවිතය අතින්

දකුණු ආසියාවේ ඉහලම ස්ථානයකට පත් ඇත්තේ ද ශ්‍රී ලංකාවයි. (අයි යු සී එන් රතු දත්ත වාර්තාව) බද්ධ පැල විශාල වශයෙන් භාවිතා කිරීම සහ ව්‍යාප්ත කිරීම හේතුවෙන් ලංකාවේ කෘෂිකාර්මික ජාන විවිධත්වය ද අවදානම් තත්ත්වයට පත්වෙමින් පවතී.

නුදුරු අනාගතයේදී ඇතිවිය හැකි දේශගුණික විපර්යාස සහ ගෝලීය උෂ්ණත්වය ඉහලයෑම වැනි කරුණු කෙරෙහි අවධානය යොමු කරමින් එම බලපෑම් අවම කර ගැනීමට හැකි උපාය මාර්ග සැලසුම් කර ක්‍රියාත්මක කිරීමේ අභියෝගයට අප ද මුහුණපා ඇති බව පිළිගත් කරුණකි. ලංකාවේ දැනට පවතින වනාන්තර ආරක්ෂා කර ගැනීමටත්ල ප්‍රතිරෝපනය කිරීමටත්ල විදේශ විනිමය ඉපයීමේ මාර්ගයක් ලෙසත් කාබන් වැඩි ප්‍රතිශතයක් උත්පාදනය කරන රටවල් සමග කාබන් වෙළඳ ගිවිසුම්වලට එළඹී රටවල් අතරට කඩිනමින් එකතුවූ රටවල් අතර ශ්‍රී ලංකාව ද විය. ලංකාවේ වන පියස එලෙසම ආරක්ෂා කර ගැනීමටත්ල ප්‍රතිඋත්පාදන බල ශක්තිය රැබැඅ්ඉකැ ැබැරටහ කෙරෙහි වන ආයෝජන වැඩි කිරීමට ගන්නා වෑයමට ධනාත්මක ලෙස දායක වීමේ පියවරක් ලෙස මෙය සැලකිය හැකි වුවද මෙයට පටහැනිව සිදු කරන ව්‍යාපාරික කටයුතුල දේශපාලනික බලය යොදා වන ඉඩම් අත්පත් කර ගැනීම්ල මහා පරිමාන වේලි බැඳීමේ ව්‍යාපෘති මෙන්ම අනවසර අත්පත් කර ගැනීම් හේතුවෙන් ලංකාවේ වනාන්තර විනාශ වෙමින් පවතී. රජය මගින් වන්නි ප්‍රදේශයට බෝම්බ හෙලීමෙන් සැලකිය යුතු වන භූමි ප්‍රමාණයක් විනාශ වී ඇති බව එල්ටිටිඊ සංවිධානය පවසයි.

දශක ගණනාවක් පුරා වෙරළ කලාපයට සිදු කරන ලද හානිය 2004 සුනාමි ව්‍යසනය මගින් පෙන්වා දෙන ලදි. වෙරළ කලාපය පුනරුත්තාපනය කිරීම පිණිස කඩොලාන සහ වෙනත් වගාවන් සිදු කළ ද කොරල් කැඩීම සහ වැලිගොඩදැම්මේ අනවසර ක්‍රියාවන් තවමත් සිදුවෙමින් පවතී. ගංවතුර සහ නායයාමේ සිද්ධීන් ගණනාවක් පසුගිය කාලය පුරා ලංකාවේ විවිධ ප්‍රදේශවලින් වාර්තා විය.

මෑත කාලයේ දී යාල සහ උඩවලවේ ප්‍රදේශයෙන් වාර්තාවූ සිද්ධීන් පාරිසරික වශයෙන් තර්ජන ඇති කිරීමට සමත් වී ඇති අතර එවැනි අස්ථාවර වාතාවරණයන් අනවසර සතුන් දඩයම් කරන්නන්ටල පතල් කැණීම්වලට සහ දැව ජාවාරම්කරුවන්ට මෙම ආරක්ෂිත වනභූමිය තුළ සිය කටයුතු පහසුවෙන් කර ගෙන යාමට ඉඩකඩ සලසයි. ඒ අවට වෙසෙන ගම් වැසියන්ට ගිනි අවි ලබාදීම ද වන සතුන් සහ මිනිසුන් අතර ඇති ගැටුමට සහ සතුන් දඩයම් කිරීම තව තවත් උග්‍ර කිරීමට මඟ පාදනු ඇත. නිල නොවන ආරංචි මාර්ගවලට අනුව එල් ටි ටි ඊ සංවිධානය විසින් ලංකාවේ සිට ඉන්දියාවට ආරක්ෂිත විශේෂ වරදැවැජජවා ˜වැජසි අපනයනය කිරීමේ ද යෙදී සිටිති.

## සිවිල් සංවිධාන සහ මාධ්‍යය අවකාශය



වාර්ගික අර්බුදයට යුදමය විසඳුමක් සෙවීමට රජය පෙළඹී ඇති බව දැනට බොහෝ පිරිසකගේ විශ්වාසය බවට පත්ව ඇත. බහුතර ජන කොට්ඨාශය වන සිංහල ජනතාවගෙන් 50% ක් පමණ මෙය සිදු කළ හැකි යැයි විශ්වාස කළ ද සුළුතර ජනතාව මෙම අදහසට දායකත්වය දක්වන්නේ නැත. යුද්ධය කෙරෙහි රජයේ ඇති ප්‍රතිපත්ති තීරණය කරනු ලබන්නේ රජය විසින් පාර්ලිමේන්තුවේ බහුතරය තහවුරු කර ස්ථාවර කර ගැනීමට දරණ ප්‍රයත්නය මත බව පෙනී යයි.

විවේචනයන් ද ත්‍රස්තවාදයට සහයෝගය දැක්වීමක් ලෙස සලකන රජයක් යටතේ සටන් විරාම ගිවිසුම අහෝසිවීමත් සමග සිවිල් සංවිධානවල ක්‍රියාකාරීත්වය නිහඬ කර ඇති අතර දැනට නැගෙන එකම සිවිල් සංවිධාන හඬ වන්නේ “ජාතිය සුරැකීමේ ව්‍යාපාරය“ විසින් ඉල්ලා සිටින එල්ටිටිඊ සංවිධානය තහනම් කිරීම සහ එක්සත් ජාතීන් ගේ සංවිධානයේ ක්‍රියාකාරකම් සීමා කිරීම යන්නයි.

මාධ්‍යයේ ඇතැම් කොටස් ස්වයං වාරණයන් තුළ ක්‍රියාත්මක වෙමින් රජයේ ප්‍රතිපත්තීන් සෘජුව විවේචනය කිරීමෙන් වැලකී සිටින අතර රාජ්‍යය නොවන සංවිධානවලට විරුද්ධව ක්‍රියාකිරීමේ නැඹුරුවක් ද පෙන්නුම් කරයි.

අකර්මන්‍යය අයුරින් හැසිරෙන පාර්ලිමේන්තු විපක්ෂය මෙම රජය ජාත්‍යයන්තර වශයෙන් හුදකලාවන බව හුවා දැක්වීමට වෑයම් කළ ද ජාතිකත්වය කෙරෙහි නැඹුරුව කටයුතු කරන මානසිකත්වයක් ඇති ජනතාවට ඉන් යම් බලපෑමක් ඇති කළ නොහැකි බව පෙනී යන අතර රජය ද උද්ධමනයෙන් හේතුවෙන් ජනතාව තුළ ඇති වන අප්‍රසාදය ද මෙමගින් සඟවා ගෙන ඇත.

## මානුෂිය සහ සංවර්ධනයට ඇති අවකාශය



ජනවාරි 01 උදාවත්ම එක්සත් ජාතික පක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රී මහේෂ්වරන් මහතා ඝාතනය වූ අතර රජය ද සටන් විරාම ගිවිසුම අහෝසි කිරීමට අදහස් කරන බව ප්‍රකාශයට පත් කරන ලදී. මෙම ප්‍රකාශයත් සමගම ආධාර දෙන ආයතනල යුද්ධය දැඩිව වර්ධනය වන ප්‍රදේශවල සිය මානුෂිය සේවාවන් සැපයීමට ඇති හැකියාව පිළිබඳව අවධානය යොමු කරන ලදී. මෙහිදී රජය පවසා සිටියේ සටන් විරාම ගිවිසුම ඇරඹීමට පෙර සිට මෙම ප්‍රදේශයන්හි මානුෂිය සේවා සැපයුම ක්‍රියාත්මක වූ බව සහ ඒ සඳහා අවකාශ හිමිව තිබූ බවයි. කෙසේ වුවද ආධාර අවශ්‍යය ප්‍රදේශයන්ට ප්‍රවේශවීමට හෝ ආධාර සැපයීම සීමා කිරීමට පෙළඹුණහොත් ඒ සඳහා ගත යුතු උපාය මාර්ගික සැලසුම් සකස් කිරීම අවශ්‍යය වනු ඇත.

එක්සත් ජාතීන් ගේ සරණාගත කොමිසම මගින් ඉදිරිපත් කළ නවතම වාර්තාවට අනුව 2006 අප්‍රේල් මාසයෙන් පසු 2007 දෙසැම්බර් මස 31 දක්වා මෙරට අවතැන්වූ ජනතාව 187 850 ක් විය. මෙම සංඛ්‍යාව පසුගිය වසරේ මඩකලපුවේ විවිධ ප්‍රදේශවල යළි පදිංචි කළ සංඛ්‍යාවට අමතර වන අතර 2006 අප්‍රේල් මාසයට පෙර අවතැන්ව සිටි පිරිස සහ සුනාමිය හේතුවෙන් අවතැන්ව තාවකාලික කඳවුරුවල සිටින පිරිස මෙම සංඛ්‍යාවට අයත් නොවේ.නැගෙනහිර පළාතේ හටගත් ගංවතුර හේතුවෙන් එහි කෘෂිකාර්මික අස්වැන්නට හානි වී ඇති අතර ඒ හේතුවෙන් ලබා දෙන සහන සේවා තවදුරටත් සැපයීමේ අවශ්‍යතාව පැණ නැඟිණ. මඩකලපුව දිස්ත්‍රික්කයේ අවතැන්වූ ජනතාව වෙසෙන කඳවුරු සඳහා සපයා ඇති ද්‍රව්‍යය මංකොල්ලාකෑමේ අවස්ථාවන් කීපයක් මෑතකදී වාර්තා විය. අවතැන්වූ පිරිසි යළි පදිංචි කිරීමේ කාර්යය සඳහා භාවිතා කිරීමට සපයා ඇති ගොඩනැගිලි ද්‍රව්‍යය එසේ පැහැර ගැනීම හේතුවෙන් එම කාර්යයයේ නියුතු සංවිධානයන්ට එම ද්‍රව්‍යය යළි සපයා ගැනීමට නොහැකි වී ඇති අතර එනිසා යළි පදිංචි කටයුතු අඩාලවීමට වීමට ද හේතුවිය හැකිය.

භාණ්ඩ රැගත් නැව් වරින් වර යාපන අර්ධද්වීපයට ළඟාවීමත් සමගම එහි ආහාර ද්‍රව්‍යය සැපයුම වැඩි වී ඇත. කෙසේ වෙතත් ඔවුන්ට ජීවිකාවන් සැලසීමට හැකි අවකාශයක් සකස් කිරීම කෙරෙහි අවධානය යොමුවිය යුතුවේ.

හමුදා සහ සිවිල් පරිපාලනය උතුරු නැගෙනහිර ප්‍රදේශවල විශ්වාසය ගොඩනැගීමේ සහ ස්ථාවරත්වයක් ඇති කිරීමේ වෑයමේ සැලසුම් අවදියේ යම් ප්‍රගතියක් අත්පත් කර ගැනීමට සමත්වී ඇත. විශ්වාසය ගොඩනැගීමල ස්ථාවරත්වයක් ඇති කිරීම සහ මානුෂිය සහන සැපයීමේ ක්‍රියාකාරකම් සඳහා පහසුකම් සැපයීමට ජාතික සහ දිස්ත්‍රික් මට්ටමින් හමුදා සම්බන්ධීකරණ නිලධාරීන් පත් කර ඇති අතර ඔවුන්ට සාමාන්‍යය ජනතාවගේ සහයෝගය ලැබෙන බව නිසැකය.

# දිස්ත්‍රික්ක පිළිබඳ විශ්ලේෂණය - 2008 ජනවාරි මස 1 -28 දක්වා

## අම්පාර

**ව්‍යුහයන්**

මෙම මාසයේ ඇතිවූ අධික වර්ෂාව හේතුවෙන් වූ ගංවතුර පවුල් 30 000 ක් වඩා වැඩි සංඛ්‍යාවක් අවතැන් කිරීමට සමත්විය. ගැටුම්කාරී ව්‍යුහයන්ට තුඩු දෙන අනෙක් කරුණ වූයේ මුස්ලිම් කොන්ග්‍රසය පාර්ලිමේන්තුවේ විපක්ෂය හා සම්බන්ධවීමල නැගෙනහිර පළාතේ මැතිවරණය පිළිබඳව රජය ප්‍රකාශයට පත් කිරීමල එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රිවරයකු වන ටි මහේෂ්වරන් මහතා ඝාතනය කිරීමල එල්ටිටිඊ සංවිධානයට අයත් යැයි විශ්වාස කරන පිරිසක් විසින් මොනරාගල ප්‍රදේශයේ ඝාතන සිදු කිරීම මෙන්ම පළාත් පාලන මැතිවරණයේ දී අවිගත් කණ්ඩායමක් වන පිල්ලයාන් කල්ලිය ප්‍රධාන භූමිකාවක් ඉටු කිරීමට පෙළඹීමයි. ප්‍රදේශයේ සිදුවූ ප්‍රචණ්ඩකාරී ක්‍රියා අතර ඝාතනය කිරීම්ල ආයුධ සන්නද්ධ කණ්ඩායම් අතර ගැටුම්ල පැහැර ගැනීම් මංකොල්ලකෑම් ආදිය තව දුරටත් පැවතිණි. ආරයම්පති ප්‍රදේශයේ හින්දු කෝවිලකට හානි පැමිණීවීම ප්‍රදේශයේ මුස්ලිම් සහ ද්‍රවිඩ ජනතාව අතර යම් නොසන්සුන්තාවයක් ඇති කිරීමට සමත්විය.

**ක්‍රියාකාරීන්**

නැගෙනහිර පළාතේ ක්‍රියාත්මක දේශපාලන පක්ෂල රජයේ හමුදාවන්ල පොලිසියල එල්ටිටිඊල ජිහාඩ් සංවිධානය සහ පිල්ලියාන් කල්ලිය මෙහි ක්‍රියාත්මකවන ප්‍රධාන ක්‍රියාකාරීන්වේ.

**ක්‍රියාත්මක වන ආකාරය** ග

මෑතකදී ඇති වු ගංවතුර මගින් අවතැන් වූ ජනතාව යළි පදිංචි කිරීම සහ ප්‍රාදේශීය මැතිවරණ මෙම දිස්ත්‍රික්කයට වර්තමානයේ දී යම් බලපෑම් ඇති කරයි. අදාල බලධාරීන් ප්‍රමාණවත් අයුරින් ක්‍රියාත්මක නොවීම හේතුවෙන් සුනාමි ව්‍යසනය සහ ගැටුම් හේතුවෙන් අවතැන්ව තවමත් තාවකාලික කඳවුරුවල ජනතාව වෙසෙන අතර මෑතකදී ඇති වූ ගංවතුර හේතුවෙන් අවතැන් වූ ජනතාව ද මෙම කණ්ඩායමට එක්වීමෙන් මෙම ගැටළුව තවත් උග්‍ර අතට පත්ව ඇත. ගැටුම්කාරී තත්ත්වයන්ට තුඩු දිය හැකි කිසියම් හේතුවක් හෝ ඇති වෙතැයි ජනතාව විමසිල්ලෙන් පසුවෙති. ආසන්නයේ පිහිටි මොනරාගල දිස්ත්‍රික්කයේ සිදුවූ ඝාතන පිළිබඳව ද මෙම ජනතාව තුළ බියක් ඇතිවිය. මෑතකදී හඳුනා නොගත් කණ්ඩායමක් විසින් හින්දු කෝවිලකට සිදුකළ හානිය දෙමළ සහ මුස්ලිම් ජනතාව අතර ඇති සම්බන්ධතාවට අහිතකර ලෙස බලපෑම් ඇති කළේය. නුදුරු අනාගතයේ දී පැවැත්වීමට නියමිත පළාත් පාලන ඡන්දය ද ප්‍රදේශයේ වාතාවරණයට යම් බලපෑම් ඇති කරන අතර විශේෂයෙන්ම මෑතක දී අවිගත් කණ්ඩායමක් විසින් එම ඡන්ද අපේක්ෂකු පැහැර ගැනීම ද මෙම තත්ත්වයට බලපෑම් ඇති කළේය.

**ක්‍රමෝපායන් සහ විකල්පයන්**

මේ අවස්ථාවේ දී මුහුණ පා ඇති වඩාත්ම දැඩි ගැටළුව වී ඇත්තේ දෙමළ සහ මුස්ලිම් ප්‍රජාව අතර සම්බන්ධය පවත්වා ගෙන යන්නේ කෙසේද යන්නයි. මෙම ප්‍රජාවන් අතර දැනට පවතින නොරිස්සුම් ස්වභාවයට ප්‍රාදේශීය මැතිවරණය ද අහිතකර අන්දමින් බලපායි. රාජ්‍යය නොවන සංවිධාන සහ දේශපාලන පක්ෂ මෙම දෙපාර්ශවය අතර සුහදතාවය රැක ගැනීම සඳහා උත්සාහ දැරිය යුතුවේ.

## මඩකලපුව

**ව්‍යුහයන්**

නැගෙනහිර පළාතේ පැවැත්වීමට නියමිත පළාත් පාලන මැතිවරණයත් මෑතකදී මුස්ලිම් සහ දෙමළ ප්‍රජාව අතර ඇතිවූ නොරිස්සුම් ස්වභාවයත් මෙම ප්‍රදේශයේ පවතින තත්ත්වය පැහැදිලි කරයි. රජය විසින් මාර්තු මාසයේ මැතිවරණයක් පැවැත්වීම පිළිබඳ නිවේදනය කළ පසු එයට විවිධ දේශපාලන පක්ෂ විසින් විරුද්ධත්වය පළ කරන ලදී. මෙම විරුද්ධත්වයට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ මැතිවරණය හේතුවෙන් මෙම පළාතේ දැනටමත් දෙමළ සහ මුස්ලිම් ජනතාව අතර ඇති නොරිස්සුම් ස්වභාවය සහ ඝාතන තව තවත් වර්ධනයවීමට මෙය හේතුවිය හැකි බවයි. ප්‍රදේශයේ පවතින ප්‍රචණ්ඩකාරී තත්ත්වයන් අවම කිරීමට ආගමික නායකයන් සහ වෙනත් ආයතන පියවර ගෙන ඇතත් මෙවැනි තත්ත්වයක් උද්ගතවීමට ඉඩකඩ ඇති බව ඔවුන් විශ්වාස කරයි. එම නිසා ප්‍රදේශයේ ඇති ආරක්ෂක තත්ත්වයට යම් බලපෑම් එල්ල වී ඇත. දේශපාලන පක්ෂ 4 ක් එක් වී ශක්තිමත් සන්ධානයක් ගොඩනගා ඇති අතර පිල්ලයාන් කල්ලිය ඔවුන්ට ඡන්දය දෙන ලෙස ජනතාවට බලපෑම් එල්ල කරයි. යුද්ධය සුනාමිය සහ ජනවාරි මාසයේ මුල්භාගයේ දී ඇති වූ ජල ගැලීම් හේතුවෙන් අවතැන් වූ ජනතාව නිසි වාසස්ථානයන් නොමැතිව දැඩි දුෂ්කරතාවයන්ට මුහුණපා ඇත. මෙම දිස්ත්‍රික්කයේ වෙසෙන ජනතාවගේ ආර්ථිකය ද දැඩි අස්ථාවර තත්ත්වයකට පත්ව ඇත.

**ක්‍රියාකාරීන්**

ඉදිරියට පැවැත්වීම නියමිත මැතිවරණය හමුවේ පිල්ලියාන් කල්ලිය මෙම ප්‍රදේශයේ ප්‍රධාන ක්‍රියාකාරීන් බවට පත්ව ඇත. රජයේ හමුදාවන් සහ දේශීය සහ ජාත්‍යන්තර රාජ්‍යය නොවන සංවිධානවලට අයත් පිරිසද මෙහි වැදගත් ක්‍රියාකාරීන්වේ.

**ක්‍රියාත්මක වන ආකාරය**

සටන් විරාම ගිවිසුම අවලංගු කිරීමත් දකුණේ ඇතිවූ ප්‍රචණ්ඩකාරී වාතාවරණය මෙන්ම ඉදිරියට පැවැත්වීමට නියමිත මැතිවරණයත් මෙම ප්‍රදේශයේ වාතාවරණයට වර්තමානයේදී දැඩි බලපෑම් ඇති කරයි. ආරියම්පති ප්‍රදේශයේ හින්දු කෝවිලකට හානි සිදුකිරීම හේතුවෙන් මුස්ලිම් සහ දෙමළ ජනතාව අතර ඇතිවූ නොරිස්සුම් ස්වභාවය සහ ගැටුම් ද අවධානය යොමු කළ යුතු තවත් කරුණකි. සමහර දේශපාලන පක්ෂ අතර ඇති කර ගෙන තිබෙන සන්ධානයන් ද පිල්ලයාන් පාර්ශවයේ ක්‍රියාවන් ද අවධානය යොමු කළ යුතු අනෙකුත් කරුණු අතරවේ.

**ක්‍රමෝපායන් සහ විකල්පයන්**

දෙමළ සහ මුස්ලිම් ජනතාව අතර සම්බන්ධතාවයන් වහා නැවත ගොඩනැගීමට සුදුසු ක්‍රමෝපායක් කඩිනමින් අවශ්‍යයවේ. රජය සහ අදාල අනෙකුත් ආයතන දිස්ත්‍රික්කයේ සාධාරණ සහ සාමකාමී අයුරින් මැතිවරණයක් පැවැත්වීමට අවශ්‍යය අර්ථවත් පියවර ගත යුතුවේ.

## කොළඹ

**ව්‍යුහයන්**

වසර ඇරඹීමත් සමගම දෙමළ මන්ත්‍රිවරකු සහ ජාතිය ගොඩනැගීමේ අමාත්‍යයවරයා ඝාතනයට ලක් වු අතර මෙය රටේ ආරක්ෂක තත්ත්වය දැඩි කිරීමට හේතුවිය. මෙම තත්ත්වය පොදු ජනතාව තුළ නොසන්සුන්තාවයක් ගොඩනැගීමට හේතුවී ඇත. සටන් විරාම ගිවිසුම අවලංගු කිරීම මෙම නොසන්සුන්තාවය වර්ධනය කිරීමට සමත් වු අතර බුත්තල ක්ලේමෝ ප්‍රහාරයත් සමගම එල්ටිටිඊ සංවිධානය පොදු ජනතාව වෙත එල්ල කරන ප්‍රහාර තවත් දැඩි කර ඇත.

සාම ක්‍රියාවලියට අදාල කරුණු සාකච්ජා කිරීම පිණිස යශුකි ආකාෂි මහතා මෙරටට සතරවන වතාවටත් පැමිණියේය. පාලන ප්‍රදේශවලට එල්ටිටිඊ සංවිධානය විසින් එල්ල කරන ප්‍රහාර හේතුවෙන් මෙරටට ගලා එන විදේශ ආධාරවලට බලපෑම් එල්ල වන්නේ කෙසේද යන්න පිළිබඳව අවධානය යොමු කිරීමට රජයට සිදුව ඇත. මෙම අර්බුදය සඳහා රජය විසින් යෝජනා කරන නිශ්චිත දේශපාලන විසඳුම ඉදිරිපත් කරන ලෙස අකාෂි මහතා රජයෙන් ඉල්ලා සිටි අතර ඒ සඳහා හමුදාමය විසඳුම් දිගු කාලින වශයෙන් යහපත් පියවරක් නොවන බවට

ඔහු අනතුරු හැගවිය. මෙම අනතුරු ඇගවීම ද වෙනත් විදේශ රටවල් විසින් ලබා දී ඇති මෙවැනි අවවාදයන් ද රජය විසින් කෙසේ අනුගමනය කරයි ද යන්න සහ එය මෙරටට ගලා එන විදේශාධාර කෙරෙහි කුමන ආකාරයෙන් බලපායි ද යන්න සහ එම හේතුවෙන් රජය 2008 වසරේදී සිය සැලසුම් කුමන ආකාරයෙන් ක්‍රියාත්මක කිරීමට හැකිවේද යන කරුණු ඉදිරියේදී විමසා බැලිය යුතුවේ.

මේ අතර සර්ව පාක්ෂික නියෝජිත කමිටුව මගින් ඉදිරිපත් කරන ලද යෝජනාවලිය මෙම කමිටුව නියෝජනය නොකරන ලද පක්ෂවල දැඩි විවේචනයට ලක්විය. ඔවුන් ගේ මතය වූයේ මෙම යෝජනාවලිය 13 වන ව්‍යාවස්ථා සංශෝධනය මත පදනම් වුවත් එම සංශෝධනය අසම්පූර්ණ ලියවිල්ලක් බවය. විරුද්ධ පක්ෂය සහ මානව හිමිකම් සංවිධාන දිනෙන් දින වැඩිවන උද්ධමනයට විරුද්ධව කටයුතු කරන අතර ඔවුන් රජයට බලපෑම් එල්ල කරන්නේ අත්‍යාවශ්‍යය ආහාරවල මිල පිළිබඳව වහා ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙසයි.

### ක්‍රියාකාරීන්

රජයල එල්ටීටීඊ සංවිධානයල විරුද්ධ පක්ෂ සහ වෘත්තීය සමිති මෙහි ප්‍රධාන ක්‍රියාකාරීන් වන අතර එක්සත් ජාතීන්ගේ සංවිධානය සහ ජාත්‍යන්තර රාජ්‍යය නොවන සංවිධාන මෙන්ම මාධ්‍යය ද මෙහි වැදගත් ක්‍රියාකාරී කණ්ඩායම් අතරවේ.

### ක්‍රියාත්මක වන ආකාරය

අත්‍යාවශ්‍යය ආහාරද්‍රව්‍යය වල මිල ගණන් තවදුරටත් ඉහල යමින් පවතින අතර ජනතාව මෙම වැඩිවන ජිවන වියදම හමුවේ දැඩි සටනක නියැලේ. ජනතාව සිය එදිනෙදා ගමන් බිමන් සඳහා භාවිතා කරන්නේ පොදු ප්‍රවාහන සේවාවන් වන අතර එල්ටිටිඊ සංවිධානය පොදු ප්‍රවාහන සේවාවන්ට පහර එල්ල කිරීම තවදුරටත් දැඩි කර ඇත. ඒ හේතුවෙන් පොදු ජනතාව ඉතාමත් දැඩි අයුරින් අසහනකාරී තත්ත්වයකට පත්ව සිටිති. බෝම්බ සහිත වාහන කොළඹ නගරයේ සැරිසරන බවට පැතිර යන කටකථා ද නගරයේ ආරක්ෂාව දැඩි කිරීමට හේතුපාදක වී ඇත.

### ක්‍රමෝපායන් සහ විකල්පයන්

අත්‍යාවශ්‍යය ආහාර ද්‍රව්‍යයවල මිල පාලනය කිරීමට රජය වහා පියවර ගත යුතු අතර එසේ නොමැති වුවහොත් ජනතාව අසහනකාරී තත්ත්වයට පත්වීම හේතුවෙන් වැඩිවන ජිවන වියදම හමුවේ වැඩ වර්ජන සහ විරෝධතා ඇතිවීමට ඉඩකඩ ඇත. ආරක්ෂක පියවර තව දුරටත් වැඩි කර යුතු අතර එල්ටිටිඊ සංවිධාන විසින් එල්ල කරන ප්‍රහාරයන්ට මුහුණදීමට පොදු ජනතාව විමසිල්ලෙන් සිටින ආකාරය පිළිබඳව දැණුවත් කිරීම ද අවශ්‍යව ඇත. සර්ව පාක්ෂික යෝජනාවලියේ අවසන් වාර්තාවට අනුව ඉදිරිපත් කර ඇති බලය බෙදීමේ යෝජනාව සම්පූර්ණ යෝජනාවලියක් ලෙස ඉදිරිපත් කළ යුතු අතර එය සාකච්ජාවට ලක් කිරීමට සහ අදහස් ප්‍රකාශ කිරීමට විවෘත කළ යුතුය. මාධ්‍යයේ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස කෙරෙහි අවධානය යොමු කළ යුතු අතර රජය විසින් මානව හිමිකම් විපරම් කිරීමට නිසි යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කළ යුතුවේ.

## යාපනය

### ව්‍යුහයන්

වරින් වර සිදුවන ෂෙල් වෙඩි සහ ආට්ලරි ප්‍රහාරයන් ද ඉදිරි ආරක්ෂක වලල්ලේ සිට එල්ලවන බෝම්බ ප්‍රහාරයන් හේතුවෙන් ද සටන් විරාම ගිවිසුම අවලංගු කිරීමෙන් ඇති වු තත්ත්වය ද මත යාපනය දිස්ත්‍රික්කයේ තවදුරටත් නොසන්සුන් වාතාවරණයක් පවතී. එක්සත් ජාතීන් ගේ ආරක්ෂක වාර්තාවන්ට අනුව ගැටුම් හේතුවෙන් පුද්ගලයන් 29 දෙනෙකු මියගොස් ඇති අතර 9 දෙනෙකු තුවාල ලබා ඇත. පෙර මාසය හා සසඳන විට මෙම සංඛ්‍යාවේ අඩුවීමක් පෙන්නුම් කළ ද තවදුරටත් නොසන්සුන්තාව දැඩිව පවතී. පලාලියේ පිහිටි ශ්‍රී ලංකා ගුවන් හමුදා කඳවුරට එල්ටිටිඊ සංවිධානය විසින් ෂෙල් වෙඩි ප්‍රහාරයක් එල්ල කිරීමෙන් සනාථ වුයේ එම සංවිධානය සිය ඊළාම් සටන අත්හැර නොමැති බවයි. රජය විසින් ප්‍රකාශ කර ඇත්තේ එල්ටිටිඊ පාලන ප්‍රදේශ අත්පත් කර ගැනීමට රජය පියවර ගන්නා බවයි. ඒ හේතුවෙන් මෙම වසරේදී සටන් තව දුරටත් උග්‍ර අතට පත්විය හැකි අතර ඒ හේතුවෙන් ජනතාව දැඩි පීඩනයට පත්ව සිටිති.

මේ අතර වෙළෙන්දන් කීපදෙනෙකුම පවසන්නේ ඔවුන් විසින් කොළඹ සිට යාපනයට ප්‍රවාහනය කරන භාණ්ඩවලින් 20% ක් පමණ අතර මඟදී අතුරුදහන්වන බවයි. ඒ හේතුවෙන් ඔවුන්ට භාණ්ඩ මිල ගණන් ඉහල දැමීමට සිදුව ඇත. ධීවර කර්මාන්තය වැනි එදිනෙදා ආදායම් උපයා ගැනීමේ නියැලෙන පිරිසට වැඩිවන ජිවන වියදම දරා ගත නොහැකි තත්ත්වයට පත්ව ඇත.

### ක්‍රියාකාරීන්

ප්‍රධාන ක්‍රියාකාරීන් වන්නේ රජයේ හමුදාවන්ල එල්ටිටිඊ සංවිධානයල වෙළඳ ආයතනල එක්සත් ජාතීන් ගේ සංවිධානයල සහ දේශිය සහ ජාත්‍යන්තර රාජ්‍යය නොවන සංවිධානයි. දිස්ත්‍රික්කයේ ආහාර හිගයක් ඇතිවීම වැලැක්වීම පිණිස රජයේ හමුදාවන් සහ වෙළඳ සංගම් ගන්නා පියවර පැසසිය යුතුවේ.

### ක්‍රියාත්මක වන ආකාරය

එල්ටිටිඊ නායකයා ඉලක්ක කර ගනිමින් රජය විසින් කුමන හෝ අවස්ථාවක දැඩි ප්‍රහාරයක් එල්ල කරනු ඇතැයි පොදු ජනතාව අපේක්ෂා කරන අතර එමගින් වන්නි සහ මුලතිව් හි එල්ටිටිඊ සංවිධානය විසින් පාලනය කරනු ලබන සෙසු ප්‍රදේශ අත්පත් කර ගැනීමට රජය අපේක්ෂා කරයි. එවැනි ප්‍රහාරයන් හමුවේ දෙපාර්ශවයේම පිරිස සහ සිවිල් ජනතාව සිය ගණනකගේ ජිවිතවලට ද හානි පැමිණිය හැකිය. එවැනි තත්ත්වයක් උද්ගත වුවහොත් දැනට දිස්ත්‍රික්කයට අඛණ්ඩව සැපයෙන ආහාර ආදියද සැපයීමට නොහැකි වෙතැයි ජනතාව බියෙන් පසුවෙති. වර්තමානයේ දී අම්පාර සහ මඩකලපුව වැනි සමහර දිස්ත්‍රික්කවල වෙළඳපොලේ සහල් සැපයුමේ හිගයක් පවතී. යාපනය දිස්ත්‍රික්කයේ තුන්මසකට ප්‍රමාණවත් ආහාර තොග පවතින බවට දිස්ත්‍රික් ලේකම්වරයා කළ ප්‍රකාශය ජනතාවට සැනසිලිදායක පුවතකි. දිස්ත්‍රික්කයට අඛණ්ඩව ආහාර සැපයීම තහවුරු කිරීම පිණිස රජය විසින් කමිටුවක් ද පත් කර ඇත.

### ක්‍රමෝපායන් සහ විකල්පයන්

රජය විසින් ප්‍රදේශයේ සාමාන්‍යය වාතාවරණයක් පවත්වා ගෙනයෑමට වෑයම් කළ යුතු අතර එමගින් ජනතාවට සිය එදිනෙදා කටයුතු කර ගැනීමට හැකියාවක් සැලසෙනු ඇත. ජිවත්වීමට වෙර දරන ජනතාවට ආදායම් උත්පාදනය කළ හැකි මාර්ග හඳුන්වා දිය යුතුවේ. ධීවර කර්මාන්තය සඳහා යොදා ඇති සීමාවන් ලිහිල් කළ යුතු අතර සන්නිවේදන ව්‍යුහයන් ශක්තිමත් කිරීමටල වැඩිදියුණු කිරීමට සහ ආරක්ෂා කිරීමට අවශ්‍යය පියවර ගත යුතුවේ.

## මන්නාරම

### ව්‍යුහයන්

මන්නාරමේ මෑතකදී සිදු කළ ක්‍රියාන්විත මෙහෙයුම්වලට කොමාන්ඩෝ සෙබලුන් විශාල සංඛ්‍යාවක් සහභාගිවීම මෙන්ම සටන් විරාම ගිවිසුම අවලංගු කිරීමත් මගින් පෙනී යන්නේ රජය විසින් පවතින අර්බුදයට හමුදාමය විසඳුමක් සෙවීමට තීරණය කර ඇති බවයි.

මුදා නොගත් ප්‍රදේශවන පෙරියමඩු සහ තච්චනමඩු ප්‍රදේශයේ වෙසෙන සිවිල් ජනතාවට ප්‍රමාණවත් ආහාර සහ වෙනත් අත්‍යාවශ්‍යය ද්‍රව්‍යය නොලැබෙන බව වාර්තාවෙයි. මන්නාරමේ බිෂොප්තුමා විසින් මෙම ජනතාවට ලබාදෙන සහන වැඩි කරන ලෙස ඉල්ලා සිටිය ද එවැනි ආයාවනයන්ට වඩා ගැටුම් සඳහා ප්‍රමුඛත්වය ලැබී ඇති බව පෙනී යයි.

වාහන නිරන්තරයෙන්ම ආරක්ෂක පරීක්ෂාවන්ට ලක්වන හෙයින් වාහනවලට බඩු පැටවීම සහ ගොඩබෑම වරින් වර කිරීමට සිදුවන අතර ඒ සඳහා කම්කරුවන්ට අමතර ගාස්තුවක් වැය කිරීමට සිදුවෙයි. මේ හේතුවෙන් භාණ්ඩවල මිල ඉහල ගොස් ඇත.

### ක්‍රියාකාරීන්

රජයේ හමුදාවන්ල එල්ටිටිඊ සංවිධානයල මානුෂියසේවා සපයන ආයතනල මන්නාරමේ බිෂොප්තුමා සහ පොලීසිය මෙම ප්‍රදේශයේ ප්‍ර

ධාන ක්‍රියාකාරීන් ලෙස හැඳින්විය හැකිය.

**ක්‍රියාකරන ආකාරය**

අළුත් අවුරුදු උදාව මන්නාරම දිස්ත්‍රික්කයේ සිවිල් වැසියන්ට සාමයේ අපේක්ෂාවන් අත්පත් කර දීමට සමත්වී නැත. රතිඤ්ඤා හඬ වෙනුවට ඔවුන්ට ඇසුනේ ෂෙල්වෙඩි සහ තුවක්කු හඬයි. එල්ටීටීඊ සංවිධානය පරාජයට පත්වනු තුරු සිය සටන අත්නොහරින බව රජය ප්‍රකාශ කිරීමත් සමගම ප්‍රදේශයේ ගැටුම් තව දුරටත් උත්සන්නවේ යැයි ජනතාව බලාපොරොත්තුවෙයි. ආධාර දෙන ආයතන සිය කටයුතු අවසන් කිරීමට හෝ සීමා කිරීමට පියවර ගැනීම හේතුවෙන් ආධාර මත යැපෙන අවතැන් වූ ජනතාව අතර නොසන්සුන්තාවන් වර්ධනයවීමට ඉඩ ඇත. සිය ආරක්ෂාව ගැන අවධානයෙන් සිටින ජනතාවට වරින් වර හා අනපේක්ෂිත අයුරින් සිය ගමන් බිමන්වලට සීමා පැණවීම හේතුවෙන් ඔවුන් ගේ එදිනෙදා කටයුතු ඉටු කර ගැනීමේදී යම් අපහසුතාවයන්ට මුහුණදීමට සිදුව ඇත. මගී බස් සේවාවන් ද සවස 5 න් පසුව සිය ගමන් සීමා කර ඇත.

මේ අතර බොහෝ ජනතාවට ජීවන වියදම ඉතාමත් දැඩි ගැටළුවක් බවට පත්ව ඇත. මිල ගණන් අහස උසට ගොස් ඇති අතර ජනතාව ගේ සම්ප්‍රදායික ආදායම් උත්පාදන කටයුතු වන ධීවර කර්මාන්තය සහ කෘෂිකර්මාන්තය විවිධ බාධවන් මැද සීමාවීම හේතුවෙන් ආදායම් ඉපයීම ද හීන වී ඇත.

**ක්‍රමෝපායන් සහ විකල්පයන්**

මානුෂීය සේවා සපයන ආයතන විසින් හදිසි අවස්ථාවන් සඳහා වන උපාය මාර්ගික සැලැස්මක් සකස් කර ගැනීමේ අවශ්‍යතාව පැණ නැගී ඇති අතර යම් හදිසි අවස්ථාවක කඩිනමින් මානුෂීය සේවා සැපයීමේ අවශ්‍යයතාවක් එළඹුණහොත් එහි දී මෙවැනි සැලැසුම ක්‍රියාත්මක කිරීමෙන් ප්‍රාදේශීය වශයෙන් වහා ක්‍රියාත්මක වීමට එම ආයතනයන්ට හැකියාව ලැබෙනු ඇත. ප්‍රදේශය යථා තත්ත්වයට පත් කිරීමට ආරක්ෂක හමුදාවන්ද පියවර ගත යුතු අතර එමගින් ජනතාවට සිය එදිනෙදා කටයුතු ඉටු කර ගැනීමට හැකියාව ලැබෙනු ඇත.

ආරක්ෂක කටයුතු පිළිබඳ සැලකීමේ දී රජයල සිවිල් ජනතාව ගේ ආරක්ෂාව සැපයීමට තව දුරටත් පියවර ගත යුතුවේ. එමෙන්ම රාජ්‍යය නොවන සංවිධාන සිය කාර්යයන් ඉටු කරන්නේ අනාරක්ෂිත වාතාවරණයක් තුළ වන අතර මෙම අනාරක්ෂිතභාවය මෑත භාගයේ සිටතව තවත් වර්ධනය වී ඇත. එම නිසා මෙම සංවිධානවලට සපයන ආරක්ෂාව ශක්තිමත් කළ යුතු අතර එම සංවිධානවලට සිය කාර්යයන් බාධාවකින් තොරව සිදු කිරීමට සහයෝගය දැක්විය යුතුවේ.

## ත්‍රිකුණාමලය

**ව්‍යුහයන්**

ත්‍රිකුණාමලයේ ආරක්ෂාව තව දුරටත් ශක්තිමත් කර ඇති අතර මෙම ප්‍රදේශයේ සේවයේ නියුතු විශේෂ කාර්යය බලකායේ සහ පොලිස් නිලධාරීන්ගේ සංඛ්‍යාව ද වැඩි කර ඇත. ඔවුන් විසින් වරින් වර ආරක්ෂක සෝදිසි කිරීම් හා මාර්ග බාධක සෝදිසි කිරීම් සිදු කරයි. ඝාතන සහ පැහැර ගැනීම් සංසන්දනාත්මක වශයෙන් අඩු වී ඇතත් ප්‍රදේශයේ තව දුරටත් නොසන්සුන් වාතාවරණයක් පවතී. රජයේ හමුදාවන් සහ එල්ටීටීඊ සංවිධානය අතර ගැටුම්වල ප්‍රතිඵලයන් ලෙස තුවාල සිදුවීම් සහ ජීවිත හානීන් සිදුවී ඇත. රාජ්‍යය නොවන සංවිධානයක සේවකයකු ඇතුළු දෙමළ තරුණයන් කීපදෙනෙකු එල්ටීටීඊ සංවිධානයට සහයෝගය දක්වන්නේ යැයි සැකපිට අත්අඩංගුවට ගෙන ඇත. එක්සත් ජාතීන් ගේ සංවිධානයට අයත් වාහන ඇතුළු සියලු වාහන බාර්ග බාධකයන්හි දී තව දුරටත් පරීක්ෂාවට ලක්වේ.

මෑතකදී වූ අධික වාර්ෂාපතනයෙන් ඇතිවූ ගංවතුර තත්ත්වයන් හේතුවෙන් ජනතාව අවතැන්වූ අතර කෘෂිකර්මාන්තය වැනි ඔවුන් ගේ ජීවිකාවන්ට දැඩි හානි පැමිණියහ. මේ හේතුවෙන් ඊළග කන්නය එළඹෙන තෙක් මෙම ජනතාවට තව දුරටත් බාහිර සහායන් මත යැපමට සිදුවී ඇත. වට්ටමාවඩු සහ සෙම්බියිමොට්ටයි වැනි සමහර ප්‍රදේශවලට අවතැන්ව සිට නැවත පැමිණි ජනතාවට සිය කෘෂිකාර්මික බිම්වල වගා කටයුතු ඇරඹීමට රජය අවසර ලබා දී නොමැත. ධීවර කර්මාන්තයට දැනට යොදා ඇති බාධාවන් හේතුවෙන් ධීවර කර්මාන්තයේ යෙදී සිටින ප්‍රජාව අපහසුවට පත්ව ඇති අතර එයට සුදුසු විසඳුමක් ලබා නොදුන්නහොත් මෙය තව තවත් ගැටළු සහගත තත්ත්වයට පත්වීමට ඉඩ ඇත.

ප්‍රදේශයේ අවතැන්වූ ජනතාව ගේ තත්ත්වය තවදුරටත් එසේම පවතින් අතර ඒ සඳහා අවශ්‍යය මුදල් ප්‍රතිපාදන නොමැතිවීමත් රජය විසින් අනුගමනය කරන පිළිවෙත සහ ප්‍රදේශයේ ආධාර දෙන ආයතන ක්‍රියාකලාපයන් ද මෙයට හේතුවී ඇත. අවතැන්වූවන් තව දුරටත් මූලික සෞඛ්‍යය පහසුකම් පවා නොමැති තාවකාලික වාසස්ථානවල දුක්ඛිත ජීවිත ගත කරයි.

වරින් වර මාර්ග බාධක යොදමින් සිදු කරන ආරක්ෂක සෝදිසි කිරීම් හේතුවෙන් කාර්යාල සේවකයන්ටල දෛනික ඉපයීම් සිදු කරන ජනතාවට සහ දරුවන්ට නියමිත වේලාවන්ට සිය සේවා ස්ථාන සහ පාසැල් කරා ළගාවීමට බාධා එල්ලවෙයි. ප්‍රවාහන පහසුකම්ද ජනතාව අතෘප්තියට පත් කර ඇත. එල්ටීටීඊ සංවිධානය වරින් වර බස්රථවලට ප්‍රහාර එල්ල කිරීම හේතුවෙන් ජනතාව සිය ගමන් බිමන් සඳහා දුම්රිය භාවිතා කිරීමට පෙළඹී ඇත. අධික ලෙස මගීන් ගෙන් පිරී ඉතිරී ගියල නිසි වාතාශ්‍රයකින් සහ පවිත්‍රතාවයකින් තොර දුම්රිය සේවාව ජනතාව ගේ ජීවිතවලට තව තවත් දුෂ්කරතා එක් කරයි.

“පවුල් කාඩ්පත“ නිකුත් කිරීම හේතුවෙන් ත්‍රිකුණාමලයේ ජීවත්වන පවුල් හා තාවකාලිකව ජීවත්වීමට අමුත්තකු හෝ ආගන්තුකයකු පැමිණි විට ඔවුන්ට ග්‍රාමසේවා නිලධාරීතුමාගෙන් පූර්ව අනුමැතිය ලබා ගත යුතුවේ.

ගැටුම් හේතුවෙන් හානියට පැමිණි සමහර පාසැල් නැවත ආරම්භ කර ඇති අතර මෙම පාසල්වල හානියට පත් උපකරණ නැවත සපයා දිය යුතුවේ. මෙම පහසුකම් සැලසීමට ප්‍රමාදවීම තුළින් දරුවන්ට තවදුරටත් පාසැල්යාම අහිමි වී ඇත.

ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ සාම්පූර්ල මාවිල් ආරුල සහ පුල්මුඩෙයි ප්‍රදේශයන්හි එක්සත් ජාතීන් ගේ ගමනා ගමනය සීමා කර ඇත. පුල්මුඩෙයිල පදවි ශ්‍රීපුර ආදී ප්‍රදේශවල නව ව්‍යාපෘති ආදිය ඇරඹීමට පෙර මෙම ප්‍රදේශයේ තත්ත්වය දැන ගැනීමට ප්‍රදේශයේ ආරක්ෂක ප්‍රධානීන් කරුබ් හා සාකච්ඡා කර කවර ප්‍රදේශවල ක්‍රියාත්මක විය හැකදැයි තහවුරු කර ගත යුතුවේ. මුතූර් සහ කිලවෙඩ්ඩියි/ඊච්චලම්පට්ටි කරා ගමන් ගන්නා මානුෂීය සහ අනෙකුත් සේවා කණ්ඩායම් උදෑසන 7.30 ට පෙර ත්‍රිකුණාමලයෙන් පිටවිය නොහැකි අතර ඔවුන් සවස 6.30 වන විට නැවතත් ත්‍රිකුණාමලයට පැමිණිය යුතුවේ.

**ක්‍රියාකාරීන්**

රජයේ යුදල නාවුක සහ විශේෂ කාර්යය බලකායල නාඳුනන සන්නද්ධ කණ්ඩායම් සහ පිල්ලයාන් පාර්ශවය ද මෙම ප්‍රදේශයේ ප්‍රධාන ක්‍රියාකාරීන් වන අතර මාධ්‍යය රාජ්‍යය නොවන සංවිධාන සහ එක්සත් ජාතීන් ගේ සංවිධානය අනෙකුත් ක්‍රියාකාරීන්වේ.

**ක්‍රියාකරන ආකාරය**

සටන් විරාම ගිවිසුම අවලංගු කිරීමත් සටන් විරාම කමිටුව ඉවත්වීමත් රාජ්‍යය නොවන සංවිධාන සහ පොදු ජනතාව අතර යම් නොසන්සුන්තාවක් ඇති කිරීමට හේතු වී ඇත. ආරක්ෂාවන් දැඩි කර ඇතත් මෙම ප්‍රදේශයේ තත්ත්වය පෙර වසරවලටත් වඩා අස්ථාවර තත්ත්වයකට පත්වේ යැයි යන බිය මත ආධාර සහ පුනරුත්තාපන කටයුතුවල නියැලෙන සේවක පිරිස් කනස්සල්ලට පත්ව ඇත.

සටන් විරාම කොමිසමේ ත්‍රිකුණාමලයේ දිස්ත්‍රික් කාර්යාලය සිය සේවා කටයුතු අවසන් කළ අතර ඔවුන් ගේ කාර්යාල පිහිටි රේගු ගොඩනැගිල්ල නැවතත් රේගු දෙපාර්තමේන්තුවට බාරදීමට කටයුතු කර ඇත.

ත්‍රිකුණාමල නගරයට පිවිසෙන ස්ථානයන් හි දැඩි ආරක්ෂා කිරීම් සහ පරීක්ෂාවන් සිදු කරයි. මාර්ගයන් හි වැඩිපුර ආරක්ෂක භට පිරිස් යොදමින් පරීක්ෂාවන් සිදු කරන අතර මාර්ග සහ සියලු වාහන දැඩි පරීක්ෂාවට ලක්වේ.

**ක්‍රමෝපායන් සහ විකල්පයන්**

මෙම දිස්ත්‍රික්කයේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ මූලික සංවර්ධන කටයුතු ඉටු කිරීමේ කඩිනම් අවශ්‍යතාව පැණ නැගී ඇති අතර ප්‍රධාන වශයෙන් යුද්ධයෙන් හානි වී නැවතත් යථා තත්ත්වයට පත්වීමට වෑයම් කරන මේ අවස්ථාවේදී පාසැල් අළුත්වැඩියා කිරීමේ සහ පුනරුත්තාපන කිරීමේ කටයුතු ඉටු කිරීමට අවශ්‍යයව ඇත. පොදු ජනතාව අධ්‍යාපනය කෙරෙහි තබා ඇති විශ්වාසය හීන වෙමින් පවතින් අතර පාසැල් හැර යන ළමුන් පිරිස

වැඩි වී ඇත. මෙයට හේතු වූ කරුණු අතර රජය විසින් මෙම පාසැල්වලට ප්‍ර මාණවත් ගුරුවරු හා අධ්‍යාපන උපකරණ ආදිය ලබා නොදීමත් පාසැල් ළමුන්ට නිල ඇඳුම් සපත්තු ආදිය සපයා ගැනීමට නොහැකිවීමත්ල දරුවන්ට පාසැල් වෙත සැලකිය යුතු දුරක් පයින් ගමන් කිරීමට සිදුවීමත් ආදී කරුණු හැඳින්විය හැකිය.

මෑතකදී යුද්ධයෙන් හානි පැමිණි ප්‍රදේශවල ජීවත්වන ජනතාව ආර්ථික වශයෙන් සවිබල ගැන්වීමට සුදුසු ව්‍යාපෘති සහ ක්‍රමෝපායන් හඳුනාගෙන ඒවා ක්‍රියාත්මක කිරීමට කටයුතු සැලසීමෙන් ඔවුන් ගේ ජීවන තත්ත්වය නගා සිටුවීමට පියවර ගත යුතුවේ. දැනට පවතින දරිද්‍රතාවය හේතුවෙන් දරුවන් ශ්‍රමිකයන් ලෙස යොදා ගැනීමත් දරුවන් අපයෝජනයට ලක් කිරීමත් ඉහල යමින් පවතින අතර දරුවන්ට මානසික සහන සහ සහයෝගය සැලසීමේ අවශ්‍යයතාවය ද දැඩිව පැණ නැගෙමින් පවතී.

# වව්නියාව

**ව්‍යුහයන්**

වව්නියාවේ ආරක්ෂක තත්ත්වය අවිනිශ්චිත ස්වභාවයකට පත්ව ඇත. විශේෂයෙන්ම ඉදිරි ආරක්ෂක වලල්ලට ආසන්න ප්‍රදේශයේ ශ්‍රී ලංකා හමුදාවන් සහ එල්ටීටීඊ සංවිධානය අතර පැණ නැගී ඇති සටන් ද රජය විසින් සටන් විරාම ගිවිසුම අවලංගු කිරීම ද මෙයට හේතු වූ කරුණු අතරවේ.

මෙම මාසය තුළ මෙම දෙපාර්ශවය අතර ඇතිවූ ගැටුම්ල වෙනත් සන්නද්ධ කණ්ඩායම් අතර ගැටුම් සහ බිම් බෝම්බ පිපිරවීම් ආදී සිදුවීම් වාර්තාවිය. වව්නියාවේ දකුණේ සහ ඕම-න්තෙයි පිහිටි ආරක්ෂක පරීක්ෂා කිරීම් සිදුකරන ස්ථානයන් හි එක්සත් ජාතීන්ට අයත් වාහන සහ බඩු බාහිරාදිය දැඩි පරීක්ෂාවන්ට ලක් කිරීම තව දුරටත් සිදුවේ. වරින් වර මාර්ග බාධක යොදා පරීක්ෂා කිරීම සහ හමුදාව සහ පොලීසිය විසින් සෝදිසි මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම් තවදුරටත් සිදු කරන අතර වැඩිපුර හමුදා භට පිරිස් මෙම ප්‍රදේශයට යොදා ඇති අතර '9 සහ '14 මාර්ගයේ නොසන්සුන් වාතාරණය තව දුරටත් පවතී.

සටන් විරාම කමිටුව ඉවත්වීමල ඝාතන සහ පැහැර ගැනීම් තව දුරටත් සිදුවීමල මන්නාරමල යාපනය සහ කිලිනොච්චි ප්‍රදේශයෙන් අවතැන්වුවන් පැමිණීමල මෙම දිස්ත්‍රික්කයේ නොසන්සුන් වාතාවරණයක් ඇති කිරීමට සමත්වී ඇත.

අවතැන්වූ ජනතාව වෙසෙන කඳවුරුවල ආරක්ෂාව ලබාදෙන ස්ථානයන් ඉවත් කිරීම හේතුවෙන් මෙම කඳවුරු තුළ හඳුනා නොගත් අවිගත් කණ්ඩායම් විසින් යම් විනාශයන් සිදු කරතැයි එහි වෙසෙන අවතැන්වූවන් බිය පළ කරති.

**ක්‍රියාකාරීන්**

රජයේ නිලධාරීන්ල හමුදාවල පොලීසියල එල්ටීටීඊ සංවිධානයල එක්සත් ජාතීන් ගේ සංවිධානයල රතුකුරුස සංවිධානයල රාජ්‍යය නොවන සංවිධාන සහ වෙනත් අවිගත් කණ්ඩා-යම් මෙම දිස්ත්‍රික්කයේ ප්‍රධාන ක්‍රියාකාරීන් ලෙස හැඳින්විය හැකිය.

**ක්‍රියාත්මක වන ආකාරය**

එල්ටීටීඊ සංවිධානය සහ රජය අතර ගැටුම් උත්සන්න වෙත්ම අවතැන්වන පිරිස ද වැඩි වෙමින් පවතී. එක්සත් ජාතීන් ගේ සංවිධානය සහ අනෙකුත් මානුෂීය සේවා සපයන ආයතනයන්ට විසින් මෙම ජනතාවට සහන සැලසීමේ දී වඩා විශාල කාර්යයභාරයක් ඉටු කිරීමට අවස්ථාව එළඹ ඇත. කෙසේ වුවද පවතින අස්ථාවර ආරක්ෂක වාතාවරණය මධ්‍යයයේ මෙම අවතැන් වූ පිරිස් යළි පදිංචි කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදයන් පැණ නැගී අතර සමහර අවතැන් වූවන් දැන් ඉන්දියාවට පිටත්ව යෑමට පටන් ගෙන ඇත.

එල්ටීටීඊ සංවිධානය හා සම්බන්ධකම් ඇතැයි යන සැකය මත යම් පිරිස් අත්අඩංගුවට ගත් අතර ඔවුන් තවමත් පොලීසිය භාරයේ රඳවා ගෙන ඇත.

නගරයේ වාතාවරණය සන්සුන් වන අතර වෙළදාම් ආදී කටයුතු බාධාවකින් තොරව සිදුවේ. වෙළඳ ස්ථාන පස්වරු 7 පමණ වන තෙක් විවෘතව පවතී.

**ක්‍රමෝපායන් සහ විකල්පයන්**

දැනට පවතින ගැටුම් හේතුවෙන් අවතැන්වන පිරිස ඉහල යමින් පවතින අතර එම ජනතාවට සහන සැලසීමට හදිසි සැලසුම් සකස් කිරීමට සංවර්ධන සහ සහන සේවා සැපයීමේ නියැලෙන ආයතන පියවර ගත යුතුය. මෙම සංදර්භය තුළ රජය විසින් රාජ්‍යය නොවන සංවිධානවලට පණවා ඇති සීමාවන් ලිහිල් කළ යුතු අතර එමගින් ඔවුන්ට සිය කාර්යයන් වඩාත් කාර්යක්ෂම අයුරින් ඉටු කිරීමට අවකාශ සැලසෙනු ඇත.

අවතැන්වූ ජනතාව වෙසෙන කඳවුරුවල ආරක්ෂක කටයුතු පවත්වා ගෙන යාමට සුදුසු යාන්ත්‍රණයක් ස්ථාපිත කළ යුතු අතර එමගින් මෙම කඳවුරු තුළ වෙසෙන අවතැන්වූවන් ඝාතනය කිරීම සහ මංකොල්ලාකෑම වැනි මානව හිමිකම් උල්ලංඝනයවීම්වලින් ඔවුන්ව ආරක්ෂා කර ගත හැකිවේ. මෙම කරුණ කෙරෙහි මානව හිමිකම් ආරක්ෂා කරන සංවිධානයන්හි අවධානය ද යොමුවිය යුතුවේ.

අප ගේ වෙබ් අඩවියට පිවිසෙන්න

http://www.humanitarian-srilanka.org/Knowledge_Centre/Publications.php

මානුෂීය සේවායතන සමූහය විසින් ඉදිරිපත් කරනු ලබන **සංදර්භ විශ්ලේෂණය** මගින් මානුෂීය සේවා සහ සංවර්ධන කටයුතුවල නියැලෙන ආයතන සිය සැලසුම් සකස් කිරීමේ දි එක් එක් ප්‍රදේශයේ පවතින තත්ත්වය අවබෝධ කර ගැනීමෙන් එම ප්‍රදේශයේ අවශ්‍යතාවන්ට අනුකූලව මානුෂීය සහ සංවර්ධන කාර්යයන් සැලසුම් කර ගැනීමට ප්‍රයෝජනවත් වන තොරතුරු සැපයීමට අපේක්ෂා කරයි.

එමෙන්ම මෙම සංදර්භ විශ්ලේෂණය මගින් අදාල දිස්ත්‍රික්කයන්හි පවතින සාමයට ගොඩනැගීමට හෝ ගැටුම්වලට තුඩුදෙන සංවේදි තොරතුරු නිරාවරණය කරන හෙයින් ආයතනයන්ට එම ප්‍රදේශවල ගැටුම් ඇති නොවන ආකාරයට සහ ගැටුම් අවම කිරීම/සාමකාමී බවට පරාවර්තනය කිරීමට හා සාමය ගොඩනැංවීමට උපරිම අයුරින් දායක විය ආකාරයෙන් කටයුතු කළ හැකිය.

අවදානම් තත්ත්වය තක්සේරු කිරීම මගින් ආයතනයන්ට තම මෙහෙයුම් කටයුතුවල නියැලෙන අතර සිය සේවකයන් ගේ සහ එම ආයතන කටයුතු කරන ප්‍රදේශයේ ජනතාව ගේ ආරක්ෂාව ද තහවුරු කිරීමට හැකියාව ලැබේ.

බාහිර පාර්ශවයන් සලකා බැලීමේ දි (පොදු ජනතාවල ජාත්‍යන්තර ප්‍රජාව) සංදර්භ විශ්ලේෂණය මගින් උද්දේශන සඳහා අවශ්‍යය වන ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්කයන්හි පවතින තත්ත්වය පිළිබඳව ප්‍රමාණවත් මෙන්ම සමබර තොරතුරු ලබාදෙයි.

මෙම වාර්තාව පිළිබඳව ඔබගේ අදහස් සහ යෝජනා දැනගැනීමට අපි කැමැත්තෙමු.
අපගේ ඊ-මේල් ලිපිනය peacepa1@cha.lk

*මානුෂීය සේවායතන* සමූහය,
30/81, ලොන්ඩන් පෙදෙස, කොළඹ 7
දුර/ෆැක්ස්: 94-112506855ශ2598413